

# පුංචි සඳුනිගේ මැජික් වත්ත

බී.ඒ. සෙනුමි ගිහන්සා බණ්ඩාර

# පුංචි සඳුනිගේ මැජික් වත්ත

බී.ඒ. සෙනුමි ගිහන්සා බණ්ඩාර

**පුංචි සඳුනිගේ මැජික් වත්ත**

කතෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2026

කතාව සහ චිත්‍ර

**බී.ඒ. සෙනුමි ගිහන්සා බණ්ඩාර**

4 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978-624-208-919-5

# පිදුම

මිණිකැට මෙන් මුතු අකුරු
එකිනෙක
පද බැඳ
සිප් සතර මුල පුරන්නට
දිරිය දුන්
මාගේ නෙරංජලා ගුරු
මෑණියන්ට ද
නිතැතින් මාගේ සෙවනැල්ල
මෙන් හිඳිමින්
සියලු කාර්යන්ට
ශක්තියක් වන
මාගේ මවට, පියාට පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සම්බුදු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව,<br>
2026.05.10



එකමත් එක ගමක කුඩා දැරියක් ජීවත් වුණා. ඇයගේ නම සඳුනි. පුංචි සඳුනි අම්මාට උදව් කරමින් ඉතා කීකරුව සිටියා. ගමේ සැම දෙනාමත් සදුනිට ආදරෙන් කතා කළා



සඳුනි හැමදාම උදේ නැගිටලා වත්තට
යනවා. ඇය මල් වලට ජලය දමනවා.
"ලොකු වෙන්න, ලස්සන වෙන්න" කියලා
මල් වලට කතා කරනවා. මෙය දුටු
අම්මා හිනාවෙලා කියනවා, "මල්වලට
ආදරෙන් කතා කලාම ඒවා තවත්
ලස්සන වෙනවා" කියලා



පුංචි සඳුනි මල් වලට ගොඩක් ආසයි. ඇයගේ ගෙදර පිටුපස කුඩා වත්තක් තිබුණා. ඒ වත්තේ රෝස මල්, පිච්ච, කපුරු, නෙලුම්, ඕලු වගා කරලා තිබුණා. සෑම දිනකම සමනලුන්, කුරුල්ලන් මී මැස්සන් මල් වල පැණි බොන්න ආවා. සඳුනිට හරිම සතුටුයි.



එක දවසක් වත්තට පුංචි
කහ පාට කුරුල්ලෙක් ආවා.
එයාගේ පියාපත් ටිකක්
තුවාල වෙලා තිබුණා. පුංචි
සඳුනිට දුක හිතුණා.

"බය වෙන්න එපා, මම ඔයාට
උදව් කරන්නම්" කියලා සඳුනි
ඒ පක්ෂියාව හෙමින් අතට
ගත්තා. ඉක්මනින්ම නිවසට
ගිය ඇය
අම්මාගෙන්
උදව් ඉල්ලා
කුරුල්ලා
කුඩා
පෙට්ටියක තැබුවා.
මුලින්ම වතුර ටිකක් ගෙන
කුරුල්ලාගේ හොටය ළඟට
තබා පෙව්වා.




දවස් කිහිපයක් යන විට පක්ෂියා ටික ටික සුව වුණා. සඳුනි හැමදම කෑම දුන්නා. "ඔයාට නමක් දාමු, බට්ටි කියලා හරිද?" කියමින් ඇය හිනාවෙලා කුරුල්ලා අතට ගත්තා. දැන් නම් බට්ටිත් "චීචී" ගාමින් සතුටින් ජීවත් වුණා.



දින කිහිපයකට පසු බට්ටිගේ පියාපත් හොඳටම සුවවුණා. එදා සඳුනි කුරුල්ලාව වත්තට ගෙනාවා.

"දැන් ඔයාට පියාඹන්න පුළුවන්" නමුත් මාව අමතක කරන්න එපා හොඳේ. " කියලා සඳුනි කිව්වා. කුරුල්ලා එක පාරටම අත්තටු ගසමින් අහසට පියඹා ගියා.

බට්ටි අහසට පියාඹලා වටයක් ගිහින් නැවතත් වත්තේ ගසක් මත හිඳ ගත්තා. ඒ වගේම තවත් කුරුල්ලන් කිහිපදෙනෙක්ම වත්තට ආවා. වත්ත කුරුල්ලන්ගේ සතුටු හඬවල් වලින් පිරුණා.






කෙනෙකුට
කරුණාවෙන් උදව්
කලාම ලෝකය තවත්
ලස්සන වෙනවා කියලා
පුංචි සඳුනිට තේරුම්
ගියා. සතුන්ටත්
මිනිසුන්ටත්
කරුණාවෙන් සලකන්න
අපි හැමෝම සිතට
ගනිමු. කරුණාව අපිට
සතුට ගෙනදෙයි.



ගමේ සැමදෙනාම
සඳුනිගේ මල්
පිරුණු වත්ත
බලන්න ආවා. මල්
පිරිලා සැම තැනම
සුවඳින් පිරිලා.
සඳුනිගේ අම්මාට
ලොකු ආඩම්බරයක්
සිතුනා දුව ගැන

"මගේ හොඳ දුව"
කියා අම්මා සඳුනිව
ළඟට ගත්තා.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක්' බව අධ්‍යාපනඥයින්'ගේ' පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්